ලෝක ව්‍යාප්ත වසංගතයක් ලෙසින් කොවිඩ්-19 පැතිර යෑමට පටන් ගත් වකවානුවේ සිට අද දක්වාම, කොවිඩ්-19 හා සම්බන්ධ බොහෝ සාවද්‍ය කතාන්තර, කුමන්ත්‍රණ කතාන්තර සහ දුස්තොරතුරු ලෝකයේ පැතිර යයි. නමුත්, මේ බොහෝමයක් නිවැරදි නොවන බවට ලෝකයේ පිළිගත් මාධ්‍ය ඔස්සේ මේ වනවිට කරුණු තහවුරු කර තිබීමද විශේෂයකි. නමුත් කණගාටුව වන්නේ, අප රටේ ඇතැම් ජාතික පුවත්පත් පවා නිවැරදි කරුණු සොයාබැලීමකින් තොරව, කිසිදු පිළිගත හැකි මූලාශ්‍ර දැක්වීමකින් තොරව මෙවැනි හිතළු, කුමන්ත්‍රණ කතාන්තර සහ දුස්තොරතුරු සමාජගත කිරීමයි.

දිවයින ඉරිදා සංග්‍රහයේ (08/15)"එන්නත් බලහත්කාරය සමාජ දේශපාලන සුන්නතක ආරම්භයක් ද" යන සිරස්තලයෙන් යුතුව පළවී තිබෙන ලිපිය ඊට උදාහරණයකි.

මෙම ලිපියේ දැක්වී ඇති කරුණු වලින් බොහෝමයක් මේ වනවිටත් පිළිගත් මාධ්‍ය සහ කරුණු වල වැරදි නිවැරදි බව සොයන පර්යන්තයන් ඔස්සේ නිශ්ප්‍රභා කෙරී ඇත. නමුත්, මෙම ලිපියේ ඒ පිළිබඳව දැක්වී නොමැතිවා පමණක් නොව, අඩු තරමින් මෙම කරුණු අතිශයින්ම මතභේදකාරී වන බව සහ ඒවාට ප්‍රතිවිරුද්ධ කරුණු පවා ඉදිරිපත් වී ඇති බවද එම ලිපියේ සඳහන් නොවේ.

මෙවැනි ලිපියකින් සිදුවිය හැකි බරපතළ අනර්ථයක් වන්නේ, එන්නත්කරණ භීතිකාවක් ඇතිවීම ඔස්සේ වත්මන් කොවිඩ්-18 මර්දන එන්නත්කරණ ක්‍රියාවලියට පවා බාධා එල්ලවිය හැකි වීමයි. එසේ නම්, මෙවැනි තොරතුරු නිසි මූලාශ්‍ර පදනමක් හෝ විශ්වසනීය භාවයකින් තොරව ඉදිරිපත් කිරීම වගකීම් විරහිත නොවන්නේද? එසේම එය මාධ්‍ය ආචාර ධර්මයන් පවා උල්ලංඝනය නොකරන්නේද?

ඉරිදා දිවයින සම්පූර්ණ ලිපියට ප්‍රවේශය
මෙතැනින්: https://bit.ly/3kjXxzw

මූලාශ්‍ර:

https://www.bbc.com/news/52847648 https://factcheck.afp.com/moderna-boss-did-not-say... https://www.reuters.com/.../factcheck-africa-leaders...

**#MediaEthicsSL #lka #SinhalaNews #SundayDivana**